*සැ. යු.* - 2021.09.10 දින පළකරන ලද අංක 2245 දරන *ගැසට් පත්‍රය* IV(අ) සහ IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,246 - 2021 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.09.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1908 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1910 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ඔක්තෝබර් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුරාධපුර

### රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම - 2022 වර්ෂය

2022 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුණු රා විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ.

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි

(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි

02. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක්ම රු. 2,000.00 මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමෙන් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන් වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර් පතක්ම සීල් තබන ලද කවරයක බහා එහි වම් පස ඉහළ කෙළවරේ "2022 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කර 2021 ඔක්තෝබර් මස 06 වැනි දින පෙ. ව. 10.30ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය. 2021.10.06 දින පෙ. ව 10.30ට ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් අදාළ දින නියමිත වේලාවට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පතු මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල මුදලින් ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නාගේ නාමලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටවිය යුතු ප්‍රදේශය හා කොටස* | *තැබෑරුම විවෘත කරන වේලාව* |
|---|---|---|---|
| 01 | අනුරාධපුර | අනුරාධපුර නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 10.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට 9.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයා ගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම් වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර එසේ කිරීමට ගතයුතු අනුමැතිය බලය ලැබීමේ අනුමැතිය ආරම්භ වීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබැරුම් පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වනවිට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත යුතු ය.

ඊ. එම්. ආර්. පී. බී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2021 සැප්තැම්බර් මස 06 වැනි දින,

09-101

---

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

කොට්ටාව, බංගලාවත්ත, වීර මාවත, අංක 273 හි පදිංචි ශිරානි දමයන්ති රත්නායක වන මා විසින් එස්. එම්. ඉනෝකා පුෂ්ප කුමාරි, ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කරන ලද අංක 5215 සහ 17.11.2018 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් කොට්ටාව, බංගලාවත්ත, වීර මාවත, අංක 273 දරන ස්ථානයෙහි පදිංචි නිලාන් රත්නායක යන අයට පවරා දුන් මාගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් දැනුම් දෙමි.

ශිරානි දමයන්ති රත්නායක.

2021 සැප්තැම්බර් මස 10 වැනි දින.

09-143

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 11(5) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ තත්ත්වය වෙනස් කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

| | |
|---|---|
| සමාගමේ කලින් නම | :- හෙල ඇපරල් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී |
| සමාගමේ අංකය | :- පීවී 00205151 |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | :- නො. 35, බලපොකුණ පාර, කොළඹ 06. |
| සමාගමේ අලුත් නම | :- හෙල ඇපරල් හෝල්ඩිංස් ලිමිටඩ් |

හෙල ඇපරල් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන්,
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2021 සැප්තැම්බර් මස 10 වැනි දින

09-146

## දැන්වීමයි

### පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් PLC (PQ-200) 37 වන වාර්ෂික මහා සභා රැස්වීම

පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී. එල්. සී. සමාගමේ 37 වන වාර්ෂික මහා සභා රැස්වීම 2021 අගෝස්තු මස 30 දා නිකුත් කරන ලද රැස්වීමේ කටයුතු සඳහන් මහා සභා රැස්වීම කැඳවීමේ නිවේදනයේ ප්‍රකාරව මාර්ගගත ක්‍රමයට (Virtual Platform) 2021 සැප්තැම්බර් මස 30 දා උදෑසන 09.00ට පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමු.

රැස්වීම කැඳවීමේ නිවේදනයේ වැඩි විස්තර, න්‍යාය පත්‍රය, ප්‍රොක්සි බලපත්‍රය, ලියාපදිංචි කිරීමේ පෝරමය, කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවියේ (https://www.cse.lk/pages/company-profile/company-profile.component.html?symbol= PMB. N0000) සහ සමාගමේ වෙබ් අඩවියෙන් (http://peoplesmerchant.lk/wp-content/uploads/2013/12/Circular-to-Shareholder.pdf) දැක බලාගත හැක.

රැස්වීමට සහභාගී වීමට කැමැත්ත දක්වන කොටස්කරුවන් ඉහත දක්වා ඇති වෙබ් අඩවිවල සඳහන් කර ඇති ලියාපදිංචි කිරීම සඳහා වන පෝරමය නිසි පරිදි සම්පූර්ණ කොට රැස්වීම පැවැත්වීමට යෝජිත වේලාවට පැය 48 කට කලින් pmfagm@pmb.lk යන විද්‍යුත් තැපෑලට යොමු කළ යුතු ය.

පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී. එල්. සී. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

2021 සැප්තැම්බර් මස 07 වැනි දින.

09-178